අප සමාජයේ භාවිතා වන ඇතැම් යෙදුම් ඔස්සේ යම් යම් අයවලුන්ට ඇතිවන සිත්වේදනාවන්, ගර්හාවන් හා කොන් කිරීම් සම්බන්ධයෙන් අපි යළි යළිත් පෙන්වා දී ඇත්තෙමු. එවැනි සෘණාත්මක යෙදුම් වලට උදාහරණයක් ලෙසින් ලංකාදීප පුවත්පතේ (11/03) මෙම පුවත් වාර්තාව පෙන්වා දිය හැක.

ආබාධ සහිත වූවන් හැඳින්වීම සඳහා සෑම විටම ගර්හාත්මක නොවන, පුද්ගල ප්‍රමුඛ භාෂාවක් භාවිතා කරන මෙන් ඒ සම්බන්ධ මාර්ගෝපදේශනයන් ඔස්සේ මාධ්‍යවේදීන්ව දිරිමත් කෙරේ. විශේෂයෙන්ම අතීතයේ පටන් යම් යම් ආබාධ සහිත වූවන්ව හැඳින්වීමට භාවිතා වන ඇතැම් යෙදුම් අත් හැරීම වඩාත් යෝග්‍ය යැයි සැලකෙන්නේ, එවැනි යෙදුම් ඔස්සේ එම පුද්ගලයන්ව කොන් කිරීමකට හා ඔවුන්ට සමාජය තුළ වෙනස් ආකාරයේ සැලකුමක් ලැබීමකට ලක් වන බැවිනි. මෙම පුවත් වාර්තාවේ දැක්වෙන "ගොළු" යන යෙදුම ඊට නිදසුනකි. ඒ වෙනුවට වඩාත් යෝග්‍ය වන්නේ කථන ආබාධයක් සහිත කාන්තාවක් යන්න නොවේද?

එසේම දූෂණය හෝ කෙලෙසීම වැනි යෙදුම් ඔස්සේ වින්දිතයා අපවිත්‍ර වී ඇති බවක් දැක්වෙන බැවින්, මෙවන් පුවත් වාර්තාවක යෙදිය යුතු වඩාත් යෝග්‍ය යෙදුම වන්නේ ලිංගික අපරාධය බවද මෙසේම පවසමු.

මූලාශ්‍ර:
https://adata.org/factsheet/ADANN-writing...

http://www.disability.wa.gov.au/.../words_that_work_media...

**#MediaEthicsSL #lka #SinhalaPress #News #Lankadeepa**